# 17 අනුන්ට කැපූ වළෙහි තමා වැටීම

එක කැලයක රජ කළ, වයසට ගිය සිංහයෙක් ලෙඩ වුණා. කෑම සොයා ගෙන කැලේ ඇවිදින්නත් බෑ. ඒ නිසා ඌ ගඟක් ළඟ තිබුණු උගේ ගුහාවේ වැතිරී සිටියා.

කැලේ සත්තු නිතර නිතර සිංහයා බලන්න ආවා. සිංහයා බලන්න එන සතුන් ගැන වෘකයා සෝදිසියෙන් හිටියා. නරියා නොපැමිණි බව වෘකයා දැන ගත්තා. නරියා සමග පරණ අමනාපකමක් වෘකයාගේ හිතේ තිබුණා. නරියාගෙන් පලිගන්න වෘකයා කල්පනා කළා.

දවසක් සිංහයා ළඟට කිට්ටු වුණු වෘකයා මෙහෙම කිව්වා.

"ඔබතුමා ලෙඩ වෙලා දැන් කොච්චර කල් ද? කැලේ ඉන්න හැම සතෙක් ම ඔබතුමා බලන්න ආවා. ඒත් නරියා ආවේ නැහැ. නරියා ඔබතුමාට කිසි සැලකිල්ලක් නැහැ. ඒකයි ඒ "

සිංහයා බලන්න පැමිණෙමින් හිටි නරියාට වෘකයාගේ කතාව ඇහුණා.

" හොඳයි, බලමුකෝ " නරියා තමාට ම කියා ගත්තා.

ටිකකින් නරියා සිංහයා ඉදිරියට ආවා. නරියා දිහා රවා බලා සිංහයා ගෙරෙව්වා.



නරියා සිංහයා ඉදිරියේ වැඳ වැටුණා.

"ඔබතුමාගෙ අසනීපය සුව කරන්න බෙහෙතක් හොයන්න මම හැම තැන ම ඇවිද්දා. ඒකයි මට එන්න බැරි වුණේ." නරියා කිව්වා.

"හොඳයි, උඹ බේතක් හොයා ගත්තා ද? "

"එහෙමයි, ඒක රහසක්."

"එහෙනම් හෙමින් කියාපන්." නරියා සිංහයාගේ කන ළඟට කිට්ටු වී මෙහෙම කිවුවා.



"වෘකයකුගේ හදවත රස්නය පිටින් ම කැවොත් අසනීපය හොඳට ම හොඳ වේවි."

සිංහයා එක් වර ම වෘකයාගේ ඇඟට පැන ඌ මරා හදවත කෑවා. සිංහයා කා ඉතිරි වූ මස් ටික කෑ නරියා "අනුන්ට වළ කැපූ විට තමන් ම ඒකෙ වැටෙන බව දැන ගන්න ඕන" යයි කියමින් හිනාවෙමින් කැලයට ගියා.

## ක්‍රියාකාරකම : 1

පාඩම හොඳින් කියවන්න.

## ක්‍රියාකාරකම : 2

පහත දැක්වෙන වාක්‍යවල කළු කර ඇති පද කෙරෙහි අවධානය යොමු කරමින් නිසි උච්චාරණයෙන් යුතු ව කියවන්න.

i. සිංහයෙක් **ගඟක් ළඟ තිබුණු** උගේ ගුහාවේ වැතිරී සිටියා.

ii. සිංහයා **ළඟට** කිට්ටු වුණු වෘකයා මෙහෙම කිව්වා.

iii. "**හොඳයි බලමුකෝ**" නරියා තමාට ම කියා ගත්තා.

iv. නරියා සිංහයා ඉදිරියේ වැඳ වැටුණා.

v. "හොඳයි **උඹ** බේතක් හොයා ගත්තා ද?

iv. නරියා සිංහයාගේ කන **ළඟට** කිට්ටු වී මෙහෙම කිව්වා.

vii. "වෘකයකුගේ හදවත රස්නය පිටින් ම කෑවොත් අසනීපය ඉක්මනට **හොඳට ම හොඳ** වේවි."

viii. සිංහයා එක් වර ම වෘකයාගේ **ඇඟට** කඩා පැන ඌ මරා හදවත කෑවා.

## ක්‍රියාකාරකම : 2

පහත දැක්වෙන වාක්‍ය හොඳින් කියවා එක් එක් වාක්‍ය යුගලවල කළු කර ඇති පදවල අදහසේ වෙනස වටහා ගන්න.

මල්ලී <u>අඹ</u> කඩනවා. ( අඹ පලතුරකි. )
නංගී <u>අබ</u> වේලනවා ( අබ ධාන්‍යයකි. )

පුතා මවට <u>වැඳ</u> පාසලට ගියේ ය. (වැඳ වඳිනවා)
මල්ලී කාමරයට <u>වැද</u> දොර වසා ගත්තේ ය. (වැද ඇතුළු වී)

## ක්‍රියාකාරකම : 3

වරහන් තුළින් ගැළපෙන වචනය තෝරා වාක්‍ය සම්පූර්ණ කර ලියන්න.

i. ............................................... වහින්න වගෙයි. ( අද , අඳ )

ii. ............................................... මිනිසාට සුදු සැරයටියක් ඇත. (අද , අඳ)

iii. මිනිස්සු ........................................ එගොඩට යති. ( අගුලෙන් , අඟුලෙන් )

iv. ............................................... දමා දොර වහන්න. ( අගුල , අඟුල )

v. මේ ..................................................... කොස් ලීයෙන් තනා ඇත.
( ඇඳ , ඇද )

vi. මේ ලී ..................................................... වී ඇත.
( ඇඳ , ඇද )

vii. විශාල ............................................ අඹරන්නේ පොල් කෙඳිවලිනි.
(කබ , කඹ)

viii. ඇස්වලින් ....................................... ගැලීම රෝග ලක්ෂණයකි.
(කබ,කඹ)

ix. අම්මා මහත් දුක් ..................................... අප ඇති දැඩි කළා ය.
(විඳ , විද)

x. දඩයක්කරුවා හීයෙන් ..................................... මුවකු මැරුවේ ය.
(විඳ , විද)

## ක්‍රියාකාරකම : 4

පහත දැක්වෙන වචන යුගල අතර තේරුමේ ඇති වෙනස හඳුනා ගෙන කෙටි වාක්‍යවල යොදන්න.

මද මඳ
කද කඳ
නුබ නුඹ
අඩ අඬ

## ක්‍රියාකාරකම : 5

නිදසුන සඳහා දී ඇති වාක්‍ය කියවන්න. එම වාක්‍යවල කළු කර ඇති පදවල රටාව හඳුනාගන්න. ඒ අනුව, වරහන් තුළ ඇති ක්‍රියා පදය ඇසුරෙන් වාක්‍යවල හිස්තැන් සම්පූර්ණ කරන්න.

**නිදසුන්**

- නරියා දිහා රවා **බලා** සිංහයා ගෙරෙව්වා. (බලනවා)
- නරියා සිංහයා ළඟට **කිට්ටු වී** මෙහෙම කිව්වා. (කිට්ටු වෙනවා)

✸ සිංහයා එකවර ම වෘකයාගේ ඇඟට **පැන** උඟු මරා හදවත කෑවා. (පනිනවා)

i. වෙළෙන්ද එළවළු ........................................... ගෙදර ගියේ ය. (විකුණනවා )

ii. ගුරුතුමා පාඩම ........................................... ප්‍රශ්න අසයි.

(කියා දෙනවා )

iii. ගොවියා පොහොර ........................................... පස සරු කරයි. (දමනවා )

iv. අයියා කන්දට ........................................... වට පිට බැලුවේ ය. (නගිනවා )

v. සමනලයෝ මල් පැණි ........................................... ඉගිලී යති. (බොනවා )

vi. මල්ලී අඹ ........................................... මට දුන්නේ ය. (කපනවා )

vii. විදුහල්පතිතුමා ........................................... රැස්වීම ආරම්භ කළේ ය. (පැමිණෙනවා)

viii. රෝගියා හෙමින් හෙමින් ........................................... රෝහලට පැමිණියේ ය. (ඇවිදිනවා)

ix. අම්මා පිටි ........................................... රසකැවිලි සෑදුවා ය. (කොටනවා)

x. ලිපිකරුවා දුම්රියෙන් ........................................... කාර්යාලයට ගියේ ය. (බසිනවා)